2018-2019 අධ්‍යයන වර්ෂය සඳහා පීඨාධිපති ප්‍රදානයන් සඳහා පහත සඳහන් සිසුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. 2000 ස්ථලයේ සිසුන් ( ඔවුන්ගේ 1000 ස්ථලය ක්‍රියාකාරකම් සඳහා )
2. 3000 ස්ථලයේ විශේෂවේදී/ සාමාන්‍යවේදී සිසුන් (ඔවුන්ගේ 2000 ස්ථලය සඳහා )
3. 4000 ස්ථලයේ විශේෂවේදී සිසුන් (3000 ස්ථලයේ ක්‍රියාකාරකම් සඳහා )

2018-2019 අධ්‍යයන වර්ෂයකට අදාළව පමණක් කුසලතා ඇගයීම සිදුකරන අතර අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ දී එම අයදුම් පත්‍රවල සඳහන් කළ යුත්තේ එම අධ්‍යයන වර්ෂයේ ඔබ විසින් සිදුකළ ක්‍රියාකාරකම්වලට අදාළ තොරතුරු පමණි.

අයදුම් කිරීම සඳහා තමන් අයදුම්කරන ස්ථලයට අදාළ අධ්‍යයන වර්ෂයේ සියළු විභාග ඇතුළු අනෙකුත් සියළු කටයුතු පවත්වා අවසන් කර තිබිය යුතුය. ඒ අනුව අයදුම්පත් ඉදිරිපත් කරනා සිසුන් අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ 2018-2019 අධ්‍යයන වර්ෂයට අදාළ ස්ථලයේ තොරතුරුය. දැනට 2000 ස්ථලයේ සිසුන් 1000 ස්ථලය සඳහා ද 3000 ස්ථලයේ සිසුන් 2000 ස්ථලය සඳහා ද 4000 ස්ථලයේ සිසුන් 3000 ස්ථලය සඳහා ද අයදුම් කළ යුතුය. ස්ථල සියල්ල සම්පූර්ණ කර තිබෙන සිසුන් සියළුම ස්ථලවල කුසලතා අනුව උපකුලපති ප්‍රදාන සඳහා අයදුම් කළ හැකිය. ඒ අනුව අදාළ විභාග අවසන් කර විශ්වවිද්‍යාලයෙන් පිටව යන සිසුන් උපකුලපති ප්‍රදානයන් සඳහා ඉල්ලුම් කළ හැකිය.

අයදුම්පත් යොමු කිරීමේදී තම අයදුම්පත්‍රයේ සඳහන් කරුණු තහවුරුකිරීමට අවශ්‍ය ලිපිලේඛණ අයදුම්පත්‍ර සමග අනිවාර්යෙන් ම ඇමිණිය යුතුය. එසේ තහවුරු කළ නොහැකි තොරතුරු ලකුණු දීම සඳහා සළකා බලනු නොලැබේ.

අයදුම් කිරීමට අදාළ අයදුම්පත්‍ර හා වෙනත් තොරතුරු https://paravi.ruh.ac.lk/stuaffair/download.php දිගුවෙන් ලබා ගත හැකිය.

අයදුම්පත්‍ර කැඳවන අවසන් දිනය වන්නේ 2020.12.18 දින වේ.